# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශේෂ

අංක 1954/30 - 2016 පෙබරවාරි මස 18 වැනි බ්‍රහස්පතින්දා - 2016.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ආසියානු සංවර්ධන බැංකු V ව්‍යාපෘතිය යටතේ හලාවත ජල සම්පාදන ක්‍රමයේ ජල රැඳවුම් තටාකයක් ඉදිකිරීමට ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 පෙබරවාරි මස 15 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1156

### උපලේඛනය

පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 568, මුන්නේශ්වරම ග්‍රාම නිලධාරී වසමේ, ලුණුපිටියවත්ත ගමේ පිහිටි ලුණුපිටියවත්ත නැමති ඉඩම පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු ජේ. පී. පී. ආර්. ජයසුන්දර මහතා විසින් පිළියෙල කරන ලද අංක 2349 දරන පිඹුරේ කැබලි අංක 02 කොටසින් සම්පූර්ණ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.224 (රූඩ් 02, පර්චස් 8.5) ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක 2349 පිඹුරේ කැබලි අංක 01 ඉඩම් කොටස හා මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල ඉඩම ; |
| *දකුණට* | : | ඇල ; |
| *බටහිරට* | : | සැලසුම් අංක 410A හි කැබලි අක්ෂර B ඉඩම් කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන් :*

01. කනගසබේ රාජමනී මිය,
කනපති හෝටලය,
මුන්නේශ්වරම, හලාවත.

02. සිංගාරවෙල් සම්මුගම් මයා,
කනපති හෝටලය,
මුන්නේශ්වරම, හලාවත.

03 - 105

1A - G 23048 — 11 (2016/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*